**ශීර්ෂ 1 සිට 22 දක්වා විශේෂ වියදම් ඒකක පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - විශේෂ වියදම් ඒකක ශීර්ෂයන්ට අදාළ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව
2 කොටස - එක් එක් විශේෂ වියදම් ඒකක ශිර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**විශේෂ වියදම් ඒකක ශිර්ෂ හා අදාල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **විශේෂ වියදම් ඒකක ශිර්ෂ හා දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව, කාර්යාලය හා කොමිෂන් සභාවේ නම |
|---|---|
| 1 | අතිගරු ජනාධිපතිතුමා |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය |
| 3 | විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු) |
| 4 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව |
| 9 | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව |
| 15 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| 16 | පාර්ලිමේන්තුව |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය |
| 18 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලය |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව |
| 21 | විගණකාධිපති |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය |

**2.** **ගිණුම්**

**2.1** **විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 22 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 15,615.785 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 14,247.732 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභාවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 0.046 ත් රු.මිලියන 844.294 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.10 ත් සියයට 46.18 ත් අතර පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව/ කාර්යාලය/කොමිෂන් සභාව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු.දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් |
| 1 | අතිගරු ජනාධිපතිතුමා | 4,659,020 | 4,410,251 | 4,490,565 | 3,734,412 | 168,455 | 675,839 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 236,325 | 96,400 | 230,443 | 72,925 | 5,882 | 23,475 |
| 3 | විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු) | 328,675 | 128,050 | 305,781 | 105,435 | 22,894 | 22,615 |
| 4 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | 121,500 | 52,200 | 89,469 | 4,.025 | 32,031 | 48,175 |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 65,075 | 12,100 | 51,896 | 2,124 | 13,179 | 9,976 |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 114,609 | 9,079 | 114,574 | 8,234 | 35 | 845 |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | 36,672 | 1,275 | 32,857 | 963 | 3,815 | 312 |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 40,023 | 5,360 | 39,674 | 5,219 | 349 | 141 |
| 9 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය | 17,075 | 915 | 13,571 | 874 | 3,504 | 41 |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 163,570 | 28,020 | 161,709 | 18,959 | 1,861 | 9,061 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 41,340 | 4,800 | 32,043 | 769 | 9,297 | 4,031 |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 27,004 | 4,050 | 25,244 | 2,619 | 1,760 | 1,431 |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 149,950 | 12,755 | 144,844 | 5,588 | 5,106 | 7,167 |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව | 450,805 | 32,300 | 450,678 | 31,959 | 127 | 341 |
| 15 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | 68,055 | 50,550 | 58,917 | 6,085 | 9,138 | 44,465 |
| 16 | පාර්ලිමේන්තුව | 1,569,827 | 114,650 | 1,535,659 | 61,383 | 34,168 | 53,267 |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | 24,725 | 1,300 | 24,132 | 1,258 | 593 | 42 |
| 18 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | 33,750 | 950 | 33,626 | 858 | 124 | 92 |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය | 62,620 | 36,425 | 60,803 | 36,275 | 1,817 | 150 |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 1,328,898 | 41,000 | 1,313,666 | 40,616 | 15,232 | 384 |
| 21 | විගණකාධිපති | 742,780 | 281,600 | 728,603 | 158,987 | 14,177 | 122,613 |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය | 8,656 | 801 | 8,611 | 800 | 45 | 1 |
| | **එකතුව** | **10,290,954** | **5,324,831** | **9,947,365** | **4,300,367** | **343,589** | **1,024,464** |

**2.2** **ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 22 ක් අතරින් එක් දෙපාර්තමේන්තුවක් විසින් 2013 වර්ෂයේදී ආදායම් සංකේතයක් සඳහා රු.මිලියන 90.00 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු අතර ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 7.98 කින් හෙවත් සියයට 8.86 කින් ඉක්මවා රු.මිලියන 97.98 ක ආදායමක් රැස් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන් දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඇස්තමේන්තුගත ආදායම ඉක්මවීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| විගණකාධිපති | 20.03.02.01 | 90.00 | 97.98 | 7.98 | 8.86 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විශේෂ වියදම් ඒකක යටතේ වන දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 21 කට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සිමාව | තථ්‍ය | අවම සිමාව | තථ්‍ය | උපරිම සිමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1 | 00101 | 23,000,000 | 21,116,324 | 12,500,000 | 19,176,280 | 100,000,000 | 75,621,858 |
| 2 | 00201 | 5,500,000 | 4,131,992 | 3,000,000 | 4,643,465 | 22,000,000 | 20,830,416 |
| 3 | 00301 | 4,000,000 | 3,949,768 | 900,000 | 2,232,234 | 11,000,000 | 6,997,762 |
| 4 | 00401 | 3,000,000 | 169,270 | 1,000,000 | 1,961,001 | 15,000,000 | 2,358,296 |
| 5 | 00501 | 3,000,000 | 2,665,664 | 2,400,000 | 2,558,132 | 14,000,000 | 10,913,332 |
| 6 | 00601 | 8,000,000 | 5,610,194 | 3,500,000 | 5,113,652 | 32,000,000 | 21,370,228 |
| 7 | 00701 | 3,000,000 | 2,517,834 | 1,200,000 | 1,686,371 | 20,000,000 | 8,088,796 |
| 8 | 00801 | 1,800,000 | 804,502 | 1,100,000 | 1,305,353 | 12,000,000 | 3,837,446 |
| 9 | 00901 | 1,000,000 | 708,565 | 200,000 | 403,043 | 3,400,000 | 1,524,758 |
| 10 | 01001 | 5,500,000 | 2,297,231 | 3,000,000 | 3,864,679 | 25,000,000 | 16,167,134 |
| 11 | 01101 | 3,500,000 | 2,053,763 | 1,000,000 | 1,619,437 | 20,000,000 | 7,154,988 |
| 12 | 01201 | 1,500,000 | 759,659 | 600,000 | 858,611 | 6,000,000 | 2,648,335 |
| 14 | 01401 | 25,000,000 | 20,638,540 | 12,000,000 | 14,020,029 | 90,000,000 | 50,500,914 |
| 15 | 01501 | 5,300,000 | 2,824,473 | 2,000,000 | 4,135,348 | 24,000,000 | 12,532,391 |
| 16 | 01601 | 39,000,000 | 21,369,869 | 24,000,000 | 29,349,039 | 175,000,000 | 136,143,054 |
| 17 | 01701 | 1,500,000 | 1,488,610 | 800,000 | 1,274,895 | 3,500,000 | 2,752,295 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 18 | 01801 | 1,500,000 | 1,490,450 | 1,000,000 | 1,622,741 | 8,500,000 | 4,523,590 |
| 19 | 01901 | 2,000,000 | 1,791,860 | 1,000,000 | 1,807,010 | 9,000,000 | 4,524,685 |
| 20 | 02001 | 23,000,000 | 19,264,340 | 13,000,000 | 14,660,729 | 80,000,000 | 62,791,918 |
| 21 | 02101 | 55,000,000 | 40,714,750 | 43,000,000 | 52,537,242 | 300,000,000 | 251,605,239 |
| 22 | 02201 | 800,000 | 301,397 | 200,000 | 531,111 | 3,000,000 | 1,634,684 |

### 2.3.2 වානිජ නොවන අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවක වානිජ නොවන අත්තිකාරම් ගිණුම් කටයුත්තක් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු අවම ලැබීම් සීමාව පිළිපැද තිබුණු අතර , උපරිම වියදම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව ඉක්මවා කටයුතු කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | සත්‍ය | අවම සීමාව | සත්‍ය | උපරිම සීමාව | සත්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 10 | 01002 | 7,000,000 | 10,595,700 | 1,500,000 | 6,962,050 | 12,000,000 | 18,585,932 |

### 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම්

දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 22 ක් අතුරින් ආයතන 17 ක 2013 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුම්වල රු.58,863,605 ක්වූ හර ශේෂ හා ආයතන 02 ක රු.1,994,261 ක්වූ බැර ශේෂ වශයෙන් ශේෂවල එකතුව රු.56,869,344 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව/ කාර්යාලය/ කොමිෂන් සභාව | ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය හර | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය බැර |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| 1 | අතිගරු ජනාධිපතිතුමා | 7002/0000/00/0117/0013/000 | 6,874,623 | - |
| 4 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | 7002/0000/00/0390/0013/000 | 17,958,186 | - |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 7002/0000/00/0119/0013/000 | 13,030 | - |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 7002/0000/00/0297/0013/000 | 787,996 | - |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | 7002/0000/00/0122/0013/000 | 1,729,387 | - |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 7002/0000/00/0365/0013/000 | 1,743 | - |

| | | | | |
|---|---|---|---|---|
| 9 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය | 7002/0000/00/0366/0013/000 | 1,019,112 | - |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 7002/0000/00/0139/0013/000 | 890,499 | - |
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 7002/0000/00/0279/0013/000 | 89,991 | - |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 7002/0000/00/0256/0013/000 | 994,887 | - |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව | 7002/0000/00/0137/0013/000 | 3,007,930 | - |
| 15 | නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0138/0013/000 | 283,687 | - |
| 16 | පාර්ලිමේන්තුව | 7002/0000/00/0120/0013/000 | 704 | - |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | 7002/0000/00/0275/0013/000 | - | 1,463,355 |
| 18 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | 7002/0000/00/0276/0013/000 | 219,258 | - |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලය | 7002/0000/00/0277/0013/000 | 2,012 | - |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 7002/0000/00/0121/0013/000 | 21,893,546 | - |
| 21 | විගණකාධිපති | 7002/0000/00/0001/0013/000 | 3,747,325 | - |
| | - එම - | 7003/0000/00/0089/0013/000 | 349,689 | - |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය | 7002/0000/00/0278/0013/000 | - | 530,906 |
| | | | --------------- | ------------------ |
| | **එකතුව** | | **58,863,605** | **1,994,261** |
| | | | ========= | ======= |

**2.4.2 පොදු තැන්පත් ගිණුම්**

2013 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු**,** කාර්යාල හා කොමිෂන් සභා 22 ක් අතුරින් ආයතන 14 ක භාණ්ඩාගාර පොත් අනුව පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.848**,**443**,**490 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව/ කාර්යාලය/ කොමිෂන් සභාව | ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| | | | රු. |
| 1 | අතිගරු ජනාධිපතිතුමා | 6000/0000/00/0006/0077/000 | 296,940,282 |
| | - එම - | 6000/0000/00/0015/0001/000 | 528,522,772 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 6000/0000/00/0015/0002/000 | 250,865 |
| 3 | විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු) | 6000/0000/00/0015/0190/000 | 238,088 |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 6000/0000/00/0015/0003/000 | 142,720 |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 6000/0000/00/0015/0008/000 | 2,289,429 |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | 6000/0000/00/0002/0032/000 | 3,375 |

| | | | |
|---|---|---|---|
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 6000/0000/00//0015/0010/000 | 3,156,234 |
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 6000/0000/00/0015/0013/000 | 247,151 |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 6000/0000/00/0015/0014/000 | 30,000 |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0110/000 | 1,179,250 |
| 15 | නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0111/000 | 3,650 |
| 16 | පාර්ලිමේන්තුව | 6000/0000/00/0015/0004/000 | 2,464,152 |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0011/0011/000 | 4,519,833 |
| 21 | විගණකාධිපති | 6000/0000/00/0015/0012/000 | 8,455,689 |
| | **එකතුව** | | **848,443,490** |

**2 කොටස**

**එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

## 1. ශීර්ෂය 1 - අතිගරු ජනාධිපතිතුමා

### 1.1 විගණන විෂය පථය

ජනාධිපති ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 16 දින ජනාධිපති ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ

ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා සහ පොත් අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි සඳහන් පොදු නිරීක්ෂණය සහ පහත 1.4 සිට 1.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------

විෂය අංක 00101 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.687,420 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.4 වත්කම් කළමනාකරණය**

---------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

----------------------------------------

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/ සමීක්ෂණ මණ්ඩල / 01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් එම වාර්තා 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**1.5 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 162 | 45 | 226 | 11 | 64 |
| (ii) | තෘතියික මට්ටම | 23 | 95 | 16 | 128 | 07 | 33 |
| (iii) | ද්විතියික මටටම | 326 | 80 | 258 | 104 | 68 | 24 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 603 | 142 | 475 | 168 | 128 | 26 |
| **එකතුව** | | **1,008** | **479** | **794** | **626** | **214** | **147** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 214 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 2. ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලය

### 2.1 විගණන විෂය පථය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන,පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 18 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ

ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා සහ පොත් අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

-------------------

වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රු. 19,600,000 ක අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.12,502,997 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය වැය විෂයයන් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

විෂය අංක 00201 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණ ශේෂවල එකතුව රු. 38,836 ක් වූ අතර, එම හිඟහිටි ශේෂය අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

---------------------------

**බේරුම් නොකළ බැරකම්**

-------------------------- -

2013 අගෝස්තු, සැප්තැම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් යන මාසවලට අදාළව 2014 වර්ෂය තුළ නිරවුල් කර තිබූ එකතුව රු.3,072,070 ක් වූ බැරකම්, විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

**2.5 පාඩු හා හානි**

"විසුම්පාය" නිල නිවසේ හා අග්‍රාමාත්‍ය කාර්යාලයේ විදුලි බිල්පත් නියමිත දිනට පෙර නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයට අදාලව පිළිවෙලින් රු.25,921 ක් හා රු.107,074 ක් වශයෙන් එකතුව රු.132,995 ක් දඩ මුදල් ලෙස ගෙවා තිබුණි.

**2.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 12 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 45 | 41 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 67 | 66 | 01 |
| | **එකතුව** | **131** | **123** | **08** |

සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විට පුරප්පාඩු 08 ක් පිරවීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.

**3. ශීර්ෂය 3 - විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු)**

**3.1 විගණන විෂය පථය**

විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලයේ (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 15 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම්

ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**3.3 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලයේ(ජ්‍යෝෂ්ඨ අමාත්‍යවරු) විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| (i). ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

| | | |
|---|---|---|
| (ii). | පරිගණක, උපාංග හා පරිගණක මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) අයවැය විචලනය**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 11 ක් සඳහා සළසා තිබුණු රු.4,250,000 ක මුළු මූලධන ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර වැය විෂයයන් 15 ක් සඳහා සළසා තිබුණු රු.1,070,000 ක මුළු පුනරාවර්තන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 72 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**-------------------------------------**

### 3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

**------------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2//3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විධිමත්ව ක්‍රියාකාරී සැලැස්මක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

**-------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් විධිමත්ව පිළියෙල කර නොතිබුණි.

**3.4.3 අභ්‍යන්තර විගණනය**

**-----------------------**

**අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.**

**3.5 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | ------------------ | ----------------- | -------------------------- |
| (i) | ලැප්ටොප් පරිගණක හා සර්වර් යන්ත්‍රය | 05 | මාස 06 |
| (ii) | ඇඟිලි සලකුණු යන්ත්‍රය | 01 | වසර 01 |

**(ආ) බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු බේරුම් නොකළ බැරකම් රු. 13,733,247 ක් විය

**3.6 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94(1) | 888,603 | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 115(3) ආ | 365,337 | ඉකුත් වර්ෂයට අදාල හිමිකම් පෑම් සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කිරිමේදි නිසි අධිකාරි බලය ලත් නිලධාරියකුගේ සහතිකයක් නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 753(1) හා මුදල් රෙගුලාසි 753(2) | 2,350,720 | භාණ්ඩ නිකුත් කිරිම හා ලැබීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි |
| (iii) මුදල් රෙගුලාසි 272(3) | 725,350 | ගෙවිම් වවුචර් 16 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 137(5) | 182,932 | වත්කම් මිලදී ගැනීමේදී ඒවා පරීක්ෂා කොට නිවැරදි ලෙස භාර ගැනීමට පෙර ඒ සඳහා ගෙවීම් කර තිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2007 මැයි 09 දිනැති අංක 10/2007 දරන චක්‍රලේඛය හා 2009 මාර්තු 05 දිනැති අංක 10/2007 (1) දරන චක්‍රලේඛය | | නිල නිවාස පහසුකම් හිමි අමාත්‍යවරුන්ට කුලී පදනම මත නිවාස ලබාගැනීම සඳහා මාසික විදුලි බිල්පත හා ජල බිල්පතද |

| | |
|---|---|
| | ඇතුළුව මාසිකව රු. 100,000 ක දීමනාවක් ගෙවීමට තීරණය කර තිබූ අතර පසුව එය රු.50,000 දක්වා අඩු කර තිබුණි. චක්‍රලේඛ විධිවිධාන එසේ වුවද, නියැදි විගණන පරීක්ෂාවේදී කාර්යාලයේ නිල නිවාස ලබාදී ඇති ජ්‍යොෂ්ඨ අමාත්‍යවරු දෙදෙනකුගේ නිල නිවාසයන් හි මාසික විදුලි බිල්පත පමණක් රු.110,000 ත් රු.133,595 ත් අතර අගයක් ගෙන තිබුණි. |

**(ඈ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

---------------------------

| | |
|---|---|
| 2013 ජුලි 12 දිනැති අංක එස්ඒ/ඒඑස්/ඒඒ දරන චක්‍රලේඛයේ 2.2 ඡේදය | විධිමත් සංකේත අංක අනුව ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විද්‍යා,තාක්ෂණ හා නවෝත්පාදනය සඳහා වූ සම්බන්ධීකරණ ව්‍යාපෘතිය විසින් වටිනාකම රු.182,932 ක් වූ ලීබඩු මිලදී ගැනීම සඳහා 2013 දෙසැම්බර් 31 දින පෞද්ගලික ආයතනයකට මුදල් ගෙවා තිබූ අතර 2014 ජූනි 11 දින වන විටත් භාණ්ඩ එම ආයතනයෙන් ලබාගෙන නොතිබුණි.

(ii) කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක නමට 2013 දෙසැම්බර් 31 දින රු. 222,040 ක චෙක්පතක් ලියා අත රඳවාගෙන පසුව දින දීර්ඝ කර 2014 මැයි 16 දින එම උපකරණ මිලදී ගෙන තිබුණි. මෙම භාණ්ඩ 2014 මැයි මස ආයතනය වෙත ලැබී තිබුණු අතර ඉන්වෙන්ට්‍රි ලේඛනයේ 2013 දෙසැම්බර් 31 දින භාණ්ඩ ලැබුණු බවට සටහන් යොදා තිබුණි.

**3.8 විසඳා නොතිබුණු විගණන ඡේද**

කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද සම්බන්ධව පසුවිපරම් කටයුතු නිම කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2012 | 1.6 (අ) | ව්‍යාපෘති ආධාරවලින් සපයන ලද වාහන එම ව්‍යාපෘතිය සඳහාම යොදවා ගත යුතු වුවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංනිවේදන හා ප්‍රතිචාර ව්‍යාපෘතිය සඳහා ලබාදුන් වාහනයක් විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය වෙත රැගෙන විත් තිබුණි. |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 04 | 15 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 35 | 24 | 11 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 102 | 102 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 140 | 140 | - |
| | එකතුව | 297 | 271 | 26 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 26 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

## 4. ශිර්ෂය 4 - උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු

---

### 4.1 විගණන විෂය පථය

---

උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 07 දින රෙජිස්ට්‍රාර් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 4.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-------------------------------------------

කාර්යාලය විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා පරිගණක මුද්‍රකාංග ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබූ රු.2,700,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 4.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-----------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම 2014 සැප්තැම්බර් 16 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 4.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.4.3 අභ්‍යන්තර විගණනය

-----------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2013 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

### 4.5 කාර්යසාධනය

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු කාර්යාලය විසින් 2013 ජනවාරි 01 දින වන විට විසඳීමට තිබුණු නඩු සංඛ්‍යාව 3,173 ක් වූ අතර, 2013 වර්ෂයේදී අලුතින් ලියාපදිංචි වූ නඩු සංඛ්‍යාව 1,654 ක් වී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේදී විසඳීමට තිබුණු මුළු නඩු සංඛ්‍යාව 4,827 ක් විය. මෙම නඩු සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේදී නඩු 1560 ක් අවසන් කර තිබුණු බැවින් 2013 දෙසැම්බර් 31 දින වන විට විසඳීමට තිබුණු නඩු සංඛ්‍යාව 3,267 ක් වී තිබුණි.

### 4.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 03 |
| **එකතුව** | **23** | **20** | **03** |

## 5. ශීර්ෂය 5 - අමාත්‍ය මණ්ඩල කාර්යාලය

### 5.1 විගණන විෂය පථය

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ

විගණන වාර්තාව 2014 අගෝස්තු 15 දින අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 5.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.9,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ii)** වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.13,687,984 ක ඉතිරිය එම වැය විෂයයන්ට අදාල

ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------------

වැටුපෙන් ණය වාරික අය කිරීමේදී ණය වර්ගය හා ගිවිස්නාව අනුව ණය වාරික අයකිරීම කළ යුතු වුවත් එසේ කටයුතු නොකළ අවස්ථා 04 ක් නිරීක්ෂණය විය.

**5.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**5.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**---------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2//3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.4.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**5.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**5.5 බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු බේරුම් නොකළ බැරකම් රු.255,507 ක් විය.

## 5.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(i) රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපිය**<br>2011 නොවැම්බර් 15 දිනැති අංක 01 දරන ලිපියේ 02 ඡේදය | 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ( v ) උපඡේදය යටතේ සඳහන් කර ඇති නිලධාරී කාණ්ඩය හෝ නිලධාරියෙකුට රජයේ වියදමින් සන්නිවේදන පහසුකම් සැපයීමට හා බිල්පත් නිරවුල් කිරීමට අදහස් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් යෝජනාවක් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ ලබා ගත යුතු වුවත්, නිලධාරීන් 13 දෙනෙකු සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**5.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

-----------------------------------------

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

**-----------------------------------------**

කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| ලේඛන ගබඩාකරණ හා කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය | 9,000,000 | 2012 | ලේඛන ගබඩාකරණ හා කලමනාකරණ පද්ධතියකට වඩා පුළුල් e – cabinet ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට තීරණය කිරීම |

**5.8 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

-----------------------------------------------------------------

පරිගණක ජාලයට සවි කිරීම සඳහා ආරක්ෂිත උපකරණයක් (Fire wall) මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී දෙවන අඩුම මිල වන රු. 262,640 ඉදිරිපත් කළ ආයතනය උපකරණය සැපයීමට සති 05 ත් 06 ත් අතර කාලයක් ගතවන බැවින් එය ප්‍රතික්ෂේප කර හතරවන අඩුම මිල වන රු.400,120 ඉදිරිපත් කළ ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම ආයතනය උපකරණය සැපයීමට මාස 07 ක කාලයක් ගත කර තිබුණි. මේ අනුව හතරවන මිලට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ගත් තීරණයෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණු අතර ඒ වෙනුවෙන් රජයට රු.137,480 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) 2012 ජනවාරි 05 දින රු.1,344,000 කට මිලදී ගත් ඡායා පිටපත් යන්ත්‍රයේ වගකීම් කාලය අවුරුදු 03 ක් තිබියදී 2013 ජුනි 25 දින රු.270,648 ක් ද , 2014 ජනවාරි 30 දින රු.120,512 ක්ද අළුත්වැඩියා වෙනුවෙන් වැය කර තිබුණි.

## 5.9 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 10 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 29 | 22 | 07 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 27 | 02 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | 80 | 67 | 16 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

## 6. ශීර්ෂය 6 - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

---

### 6.1 විගණන විෂය පථය

---

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 02 දින කොමිෂන් සභාවේ ලේකම්වරිය වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 6.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 6.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 6.4 හා 6.5 හි ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

---

වැය විෂයයන් 2 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.542,099 ක් හෙවත් එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ක් හා සියයට 78 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 00601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2001 ජුලි 01 දින සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ රු.32,320 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 6.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 6.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 41 | 33 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 06 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 96 | 74 | 22 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 48 | 33 | 15 |
| | **එකතුව** | **195** | **146** | **49** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 49 ක් පිරවීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 7. ශීර්ෂය 7 - අධිකරණ සේවා කොමිෂන් සභාව

### 7.1 විගණන විෂය පථය

අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 25 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 7.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 7.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 7.4 සිට 7.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් 02 ක් සඳහා සළසා තිබුණු රු.300,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 42 ත් සියයට 89 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) සීමා පිළිනොපැදීම හේතුවෙන් එක් වැය විෂයයක් සඳහා සළසා තිබූ ප්‍රතිපාදනය ඉක්මවා වියදම් කර තිබුණි.

## 7.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 7.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 මාර්තු 26 දිනැති අංක 28 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 7.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 සැප්තැම්බර් 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 7.4.3 අභ්‍යන්තර විගණනය

---

සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි.

### 7.4.4 විගණන හා කළමණාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම.

---

2013 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 7.5 වත්කම් කළමණාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඑෆ්/ සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එම සමීක්ෂණ වාර්තා විගණනයට 2014 ඔක්තෝබර් 13 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

අධිකරණ අමාත්‍යාංශය සතු රු.800,000 ක් වටිනා වාහනයක් විධිමත් අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් භාවිතයට ගෙන තිබුණි.

**7.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 09 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 54 | 33 | 21 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 16 | 08 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | එකතුව | 93 | 60 | 34 | 01 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 34 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 8. ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව.

### 8.1 විගණන විෂය පථය

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 මැයි 12 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 8.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 8.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 8.4 සිට 8.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

--------------------

වැය විෂයයන් 07 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08 ත් සියයට 53 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 8.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 8.4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

ජාතික පොලිස් කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 8.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

-----------------------------------------------------------

කොමිෂන් සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 8.5 වත්කම් කළමනාකරණය

-----------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

--------------------------------------------

2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 770 (2) සහ 771 (3) ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

## 8.6 කාර්යසාධනය

----------------

**පැමිණිලි විමර්ශනය**

----------------------

ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යාල 11 ක් වෙත සමාලෝචිත වර්ෂයේ දී පහත පරිදි පැමිණිලි 414 ක් ලැබී තිබුණි.

| | පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| | ------------------------- | -------- |
| (අ) | පොලීසිය විසින් ක්‍රියානොකිරීම (උදාසීනත්වය) | 134 |
| (ආ) | බලය අයථා ලෙස පරිහරණය | 103 |
| (ඇ) | පක්ෂග්‍රාහීවීම | 83 |
| (ඈ) | වෙනත් | 30 |
| (ඉ) | පහරදීම | 14 |
| (ඊ) | නීතිවිරෝධි ලෙස රඳවාගැනීම | 21 |
| (උ) | බොරු චෝදනා කිරීම / සිරභාරයට ගැනීම | 17 |
| (ඌ) | වධහිංසා පැමිණවීම | 05 |
| (එ) | කාන්තාවන්ට හා ළමුන්ට හිංසාකිරීම | 04 |
| (ඒ) | අල්ලස් හා දූෂණ | 03 |
| (ඔ) | පොලිස් අත්අඩංගුවේ දී මියයාම | - |
| | | ----- |
| | **එකතුව** | **414** |
| | | === |

සමාලෝචිත වර්ෂයේ දී එම පැමිණිලිවලින් 307 ක් හෙවත් සියයට 74 ක් විසඳා තිබුණි.

## 8.7 විමර්ශනවල ඵලදායීත්වය

----------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය අනුව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය නිසා අහෝසි වී ඇත. ඒ නිසා සමාලෝචිත වර්ෂය තුළ දී ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් සෘජුව ක්‍රියාත්මක වීමට නොහැකි වී තිබුණු අතර පරීක්ෂණයෙන් වරදකරුවන් ලෙස හඳුනාගත් නිලධාරීන් පිළිබඳ ඉදිරි කටයුතු කිරීම සඳහා එම තොරතුරු පොලිස්පතිවරයා වෙත යොමුකර තිබුණි.

**8.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 15 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | - | 03 |
| (iii) | ද්වීතියක මට්ටම | 33 | 26 | 07 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 13 | 12 | 01 |
| | **එකතුව** | **64** | **53** | **11** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වි තිබුණි.

(ආ) තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සිටින ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින් 13 ක්ද, ද්වීතියික මට්ටමේ නිලධාරින් 02 ක් හා ප්‍රාථමික මට්ටමේ එක් නිලධාරියෙක් ද ඇතුළත් වී තිබුණි.

9. **ශීර්ෂය 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

**9.1 විගණන විෂය පථය**

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජූලි 30 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය

සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

9.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

9.3 **විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි 9.4 සිට 9.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

9.4 **යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය.**

---

**9.4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

---

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 සහ ඉන් ඉදිරියට දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 9.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා

----------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර අධිකාරය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 ජුනි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 9.5 අනුකූල නොවීම්

------------------

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| II පරිච්ජේදයේ 2.1 වගන්තිය | රාජ්‍ය සේවයේ සෑම තනතුරක් සඳහාම තනතුරෙහි වැටුප් පරිමාණය, අවශ්‍ය සුදුසුකම්, වයස් සීමාව ආදී අනෙකුත් විස්තර නිශ්චිතව ඇතුළත්කර බඳවාගැනීමේ පටිපාටියක් අනුමත කරවා ගතයුතු වුවත් අධිකාරය විසින් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ්/437 දරන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල මෝටර් රථ රක්ෂණාවරණය ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබා ගත යුතු වුවත්, අධිකාරය සතු වාහනයක් එකී චක්‍රලේඛයට පටහැනිව වෙනත් රක්ෂණ සමාගමකින් රක්ෂණය කර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.112,899 ක රක්ෂණ වාරිකයක් ගෙවා තිබුණි. |

### 9.6 කාර්යසාධනය

------------------

2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 7 වගන්තිය ප්‍රකාරව විනිශ්චය අධිකාරය වෙත යම් අභියාචනයක් ලැබුණු දින සිට මාස 02 ක කාලසීමාවක් ඇතුළත විභාගකොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු බව දක්වා තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට අධිකාරයට අභියාචනා

423 ක් විසඳීම සඳහා පැවති අතර සමාලෝචිත වර්ෂය තුළදී පැමිණිලි 90 ක් පමණක් විභාග කොට අවසන් කර තිබුණි.

## 9.7 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක විස්තරය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 04 | 01 |
| (ii) | ද්විතියික මට්ටම | 12 | 09 | 03 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 04 | 04 | - |
| | **එකතුව** | **21** | **17** | **04** |

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 04 ක් පිරවීමට අධිකාරය කටයුතු කර නොතිබුණි.

## 10. ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### 10.1 විගණන විෂය පථය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 15 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 10.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

## 10.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 10.4 සිට 10.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කරන ලද ගිණුම අනුව 2013 දෙසැම්බර් 31 දිනට ඉල්ලා අස්වීම මත අයවීමට ඇති හිඟහිට තිබූ ශේෂවල එකතුව රු.133,827ක් වූ අතර එය වර්ෂ 7 කට වැඩි කාලයකට අදාල විය.

(ii) දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව ආරම්භක හා අවසාන ශේෂයන්හී රු.236,827 ක වෙනසක් විය. මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ පොත් භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා නොතිබුණි.

### (ආ) නොපියවන ලද අත්තිකාරම්

ඉදිරිපත් කරන ලද ගිණුම අනුව 2013 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අල්ලස් වැටලීම් සඳහා පරිහරණය කිරීමට ලබාදුන් අත්තිකාරම් ශේෂවල එකතුව රු.18,585,932 ක් වූ අතර එයින් වර්ෂ 4 සිට වර්ෂ 30 දක්වා වූ කාලයකට අදාළ ශේෂය රු.5,467,922 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| කාල පරාසය | නඩු සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| වසර 3 ත් 4ත් අතර | 44 | 868,500 |
| වසර 5 ත් 10 ත් අතර | 88 | 4,349,825 |
| වසර 10 ත් 20 ත් අතර | 31 | 233,320 |
| වසර 20 ත් 30 ත් අතර | 09 | 13,850 |
| වසර 30 ට වැඩි | 08 | 2,427 |
| | 180 | 5,467,922 |

ඉහත සඳහන් නඩු 180 තුළ 2013 දෙසැම්බර් 31 දින වන විට නෛතික කටයුතු නිම වී තිබුණු නඩුවලට අදාල අත්තිකාරම් නිරවුල් කළ හැකිව තිබුණත්, එම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අවස්ථාද නිරීක්ෂණය විය.

## 10.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 10.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර සභාව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 10.4.2 අභ්‍යන්තර විගණනය

කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 10.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

## 10.5 කාර්යසාධනය

2013 දෙසැම්බර් 31 දිනට විමර්ශනය කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව 2,182 ක් වූ අතර එයින් වසර 2 කට වැඩි කාලයක් ගතවී ඇතත් තවදුරටත් විමර්ශනය කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාලය | | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| වසර 4 ක් හෝ ඊට වැඩි කාලයක් ගත වී ඇති පැමිණිලි | - | 188 |
| වසර 3 ක් ගත වී ඇති පැමිණිලි | - | 170 |
| වසර 2 ක් ගත වී ඇති පැමිණිලි | - | 494 |
| | | 852 |

මේ අනුව 2013 දෙසැම්බර් 31 දිනට විමර්ශනය කරමින් පවතින පැමිණිලිවලින් සියයට 39 ක් වසර 2 සිට වසර 4 හෝ ඊට වැඩි කාලයක් පැරණි ඒවා බව නිරීක්ෂණය විය.

**10.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 20 | 14 |
| (ii) තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (iii) ද්විතියක මට්ටම | 62 | 53 | 09 |
| (iv) ප්‍රාථමික මට්ටම | 64 | 59 | 05 |
| **එකතුව** | **165** | **133** | **32** |

2013 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ පුරප්පාඩු තනතුරු 32 ක් පිරවීමට කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 11. ශීර්ෂය 11 - මුදල් කොමිෂන් සභා කාර්යාලය

### 11.1 විගණන විෂය පථය

මුදල් කොමිෂන් සභා කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ

විගණන වාර්තාව 2014 නොවැම්බර් 28 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 11.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 11.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මුදල් කොමිෂන් සභා කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 11.4 හා 11.5 ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.150,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 16 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ

ප්‍රතිපාදනයෙන් සියයට 17 ත් සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 01101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.295,236 ක් විය.

(ii) 2013 ජනවාරි 31 දිනැති අංක 157 (1) දරන ජාතික අයවැය චක්‍රලේඛයට පටහැනිව රු.250,000 ක උපරිම ණය සීමාව ඉක්මවා නිලධාරියකුට ආපදා ණය ගෙවා තිබුණු අතර, එසේ වැඩිපුර ගෙවා තිබුණු ණය 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**11.4 පාඩු හා හානි**

2013 වර්ෂයට අදාලව වාහන අනතුරු 02 ක් සිදුව තිබුණද විසර්ජන ගිණුමේ එම අනතුරු පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි. වාහන දෙකට අදාළ මුළු අලාභය රු.175,020 ක් වූ අතර ඉන් රු.17,468 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**11.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 06 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 46 | 26 | 20 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 13 | 07 | 06 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | 77 | 44 | 36 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 36 ක් පිරවීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.

## 12. ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

-----------------------------------------------------------

### 12.1 විගණන විෂය පථය

---------------------------

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 11 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 12.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 12.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 12.4 සිට 12.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග හා මුදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### (ආ) අයවැය විචලනය

පහත සඳහන් විචලනයන් අනාවරණය විය.

(i) වැය විෂයයන් 01ක් සඳහා සළසා තිබුණු රු.50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම සහ සැලැසුම් කළ ක්‍රියාවලින් ක්‍රියාත්මක නොවීම යන හේතූන් නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.1,430,894 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ත් සියයට 69 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

--------------

අග්‍රිම ගිණුමේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරක දී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය භාණ්ඩාගාර අනුමැතියෙන් රු.50,000 දක්වා වැඩි කරගෙන තිබුණු නමුත් එම සීමාවද ඉක්මවා නිලධාරින් 04 දෙනෙකුට අවස්ථා 16 කදී රු.50,000 සිට රු.130,000 අතර එකතුව රු.998,500 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) කොමිෂන් සභාවේ රැස්වීම් හා වැඩමුළු ආදිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 21 කදී ලබාදුන් එකතුව රු.638,000 ක් වූ අත්තිකාරම් වලින් රු.239,000 ක් හෙවත් සියයට 37 ක් උපයෝජනය නොකර නැවත පියවා තිබුණි. එසේම අත්තිකාරම් ලබාගත් කාර්යයෙන් බැහැරව වැය කිරීමද, ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමෙන් තොරව අත්තිකාරම් ලබාදීමද, එකම කාර්යය සඳහා ලබාගත් අත්තිකාරම් පියවීමට තවත් අත්තිකාරම් නිකුත් කරද තිබුණි.

**12.4 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

------------------------------------------

**12.4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

------------------------------

2013 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබූ අතර එම සැලැස්මෙහි ඒ ඒ කාර්යභාරයන් ඉටුකළ යුතු කාලය හෝ කාලපරාසයද, ඇස්තමේන්තුගත පිරිවැය හා එක් එක් කාර්යයන් සඳහා වගකිව යුතු නිලධාරින්ද සඳහන් කර නොතිබුණි.

**12.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා රු.850,000 ක ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනිම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම සැලැස්මේ සඳහන් නොකළ එකතුව රු.805,256 ක් වැය කර භාණ්ඩ මිලදී ගෙන තිබුණත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

**12.4.3 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**12.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කර නොතිබුණි.

**12.5 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු පාවිච්චි කළ නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**12.6 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 138 හා 245 (i) | 176,536 | ගෙවීම් වවුචර් 08 කින් කළ ගෙවීම් සහතික කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 753 (1) (2) | | භාණ්ඩ ලැබීමේදී හා නිකුත් කිරීමේදී භාණ්ඩ ලැබීම් ඇනවුම්පත් හා නිකුත් කිරීමේ ඇනවුම්පත් භාවිතා කර නොතිබුණි. |

## 12.7 කාර්යසාධනය

--------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ඉටු නොකළ කාර්යයන්**

**--------------------------**

සමාලෝචිත වර්ෂයේ ඉටුකිරීමට සැලැසුම් කළ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි.

(i) අනු ක්‍රියාකාරකම් 1 - සංවර්ධන යන්ත්‍රණය සඳහා සේවා උපදේශකවරු මාර්ගයෙන් පාසල්වලින් තොරතුරු එකතු කර ගැනීම. (Develop mechanism for collecting information from school system through in service Advisers)

(ii) අනු ක්‍රියාකාරකම් 3 - ජාතික විශ්ව විද්‍යාල සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම. ( preparation of policy proposals for development of national universities)

(iii) අනු ක්‍රියාකාරකම් 5 - විවිධ රටවල ප්‍රාථමික විෂය ධාරාව සහ ප්‍රාථමික අධ්‍යාපන අරමුණු අනුව සැසඳුම් වාර්තාව සකස් කිරීම. (preparation of comparison report on primary curriculum and primary education objectives in various countries)

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ කාර්යයන්**

**---------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ ඉටුකිරීමට සැලැසුම් කළ පහත සඳහන් ක්‍රියාකාරකම් ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණි.

(i) අනු ක්‍රියාකාරකම් 2 – කුඩා පාසල් සංශෝධනය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම. (preparation of policy proposals and strategy for development of small schools) 2012 වර්ෂයේ සිටම ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ පළාත් 09 න්ම තෝරාගත් පාසල්වලින් තොරතුරු එකතුකර කුඩා පාසල් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීමට සැලැසුම්කර තිබූ නමුත් බස්නාහිර පළාත්

පාසල්වලින් තොරතුරු එකතු කරගැනීම හැර වෙනත් කාර්යයක් සිදු කර නොතිබුණි.

(ii) අනු ක්‍රියාකාරකම් 4 – අධ්‍යාපන පද්ධතිය, කාර්යාල තුළ සිංහල භාෂාව භාවිතය සඳහා සන්නිවේදනය සහ මුද්‍රිත මාධ්‍ය ප්‍රමිති සකස් කිරීම. (preparation of standards communication and the printed media for Sinhala language usage in education system, official.) අදාල පාර්ශවයන්ගෙන් තොරතුරු එකතු කර, වාර්තාව සකස් කර තෝරාගත් පාසැල් වෙත බෙදාහැර, මත විමසුම් ලබාගෙන ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීමට සැලැසුම්කර තිබූ නමුත් සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය පිළිබඳ සාකච්ඡා වාර දෙකක් පැවැත්වීම හැර වෙනත් කාර්යයක් සිදුකර නොතිබුණි.

**12.8 අවිධිමත් ගනුදෙනු**

------------------------

කොමිෂන් සභාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) වර්ග 08 කට අයත් එකතුව රු.335,450 ක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (ඇ) මාර්ගෝපදේශයෙන් බැහැරව පිරිවිතරද ලබා නොගෙන සැපයුම්කරුවන් තෝරාගෙන එම මිලදී ගැනිම සිදු කර තිබුණි.

(ආ) හදිසි අවශ්‍යතාවයන් සේ සළකා ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයකින් තොරව රු.386,500 ක් වටිනා ජංගම පරිගණක 03 ක් සහ එම්එස් වින්ඩෝස් ඔෆිස් පැකේජ 05 ක් මිලදීගෙන තිබුණි.

**12.9 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) | තෘතීයික මට්ටම | 11 | 04 | 07 |
| (iii) | ද්විතීයික මට්ටම | 10 | 09 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | | 36 | 28 | 08 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවැති තනතුරු 08 ක් පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

**13. ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**13.1 විගණන විෂය පථය**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 28 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**13.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**13.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) ඡේදයේ වූ පොදු නිරීක්ෂණය සහ පහත 13.4 සිට 13.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.6,600,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**13.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**13.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**13.4.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණද සහය කාර්ය මණ්ඩලයක් පත් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**13.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

වත්කම් සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘතියක් මගින් ලබා දී තිබූ ධාවනයෙන් ඉවත්කරන ලද යතුරු පැදි 07 ක් හා වෑන් රථයක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) 2013 ජූනි 07, දෙසැම්බර් 26 හා 31 යන දිනයන්හිදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනක් මගින් රු.1,662,550 ක් වටිනා පරිගණක හා කාර්යාල උපකරණ තොගයක් කොමිසමේ ප්‍රධාන කාර්යාලය වෙත භාර දී තිබූ අතර එම තොගයෙන්

ප්‍රාදේශීය කාර්යාලවලට ලබා දීම සඳහා වෙන්කර තිබුණු භාණ්ඩ 2014 ඔක්තෝබර් 31 දින වන විටත් එම කාර්යාලවලට භාරනොදී නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

2010 දෙසැම්බර් 17 දිනැති අංක PF/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාව 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණේ 2012 වර්ෂය වෙනුවෙනි.

**(ඇ) ලේඛනගත නොකළ වත්කම්**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යාපෘතියක් මඟින් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලවලට සෘජුවම ලබා දී තිබූ වත්කම් පිළිබඳ තොරතුරු කොමිෂන් සභාවේ ප්‍රධාන ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් කර නොතිබුණි.

**(ඈ) වත්කම් වෙනත් පාර්ශවයන්ට ලබාදීම**

ව්‍යාපෘතියකින් කොමිෂන් සභාව වෙත ලැබී තිබූ ලැප්ටොප් පරිගණක 2 ක් මානව හිමිකම් ව්‍යාපෘතියේ නිලධාරීන් දෙදෙනෙකුට නිකුත් කර තිබුණි.

## 13.6 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | **රු.** | |
| 1983 අංක 12 දරන පාරිතෝෂික පනත | 118,012 | සේවකයකු ඉවත්වීමේදී හෝ විශ්‍රාමයාමේදී ගෙවනු ලබන පාරිතෝෂික දීමනාව අවසන්වරට ගෙවනු ලැබූ දළ වැටුප මත පදනම්ව ගණනය කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් මූලික වැටුප පදනම් කරගෙන ගෙවා තිබීම හේතුවෙන් සේවයෙන් ඉවත් වූ නිලධාරීන් හතරදෙනෙකු සඳහා පාරිතෝෂික දීමනාව රු.118,012 ක් අඩුවෙන් ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 110 | | | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | | | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| (i) | 2.4.1 මාර්ගෝපදේශය | 1,819,275 | ප්‍රසම්පාදන කාර්යයන් සඳහා විධිමත් ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. |
| (ii) | 4.3 මාර්ගෝපදේශය | 1,406,025 | පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. |
| (iii) | 8.9.1(ආ) මාර්ගෝපදේශය | - | වටිනාකම රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තු සඳහා විධිමත් කොන්ත්‍රාත්තුවක් ලියා අත්සන් කර නොතිබුණි. |
| (iv) | 9.3 (ආ) මාර්ගෝපදේශය | 227,620 | වටිනාකම රු.200,000 වැඩි වාහන අළුත්වැඩියාවන් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඉ) 2004 ජනවාරි 24 දිනැති අංක 2004/ප්‍රස/1 දරන ජාතික පුස්තකාල ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛය | | | පුස්තකාලයේ අස්ථානගත වී තිබූ පොත් 36 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

## 13.7 අවිධිමත් ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවිධිමත් ස්වභාවයේ ගනුදෙනු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කොමිෂන් සභාවේ මහනුවර ශාඛාව සඳහා වර්ග අඩි 2,400 ක පමණ ප්‍රමාණයකින් යුත් නව ස්ථානයක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව මාසිකව රු.35,000 ක කුලියට 2013 ජනවාරි 01 දින සිට ලබා ගෙන තිබුණි.

(ආ) 2003 දෙසැම්බර් 31 දිනැති අංක 113 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 8 ඡේදය ප්‍රකාරව මාසිකව වාහන කුලිය රු.40,000 ඉක්මවන අවස්ථාවලදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත

යුතු වුවත්, එයට පටහැනිව ප්‍රාදේශීය කාර්යාල 03 ක් සඳහා වාහන කුලී පදනම මත ලබාගෙන තිබුණි.

**13.8 මානව සම්පත් කළමනාකරණය.**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 20 | 26 | - |
| (ii) | තෘතියික මට්ටම | 07 | 01 | 06 | - |
| (iii) | ද්විතියික මට්ටම | 154 | 101 | 53 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 66 | 53 | 13 | - |
| (v) | වෙනත් (අනියම්) | - | 03 | - | 03 |
| | **එකතුව** | **273** | **178** | **98** | **03** |

**(ආ) සියයට 25 ක දීමනා ගෙවීම**

2009 නොවැම්බර් 24 දිනැති අංක DMS/A/08/03/1-TEM දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලිපියට අනුකූල නොවන ලෙස ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටම යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් 05 දෙනෙකුට හා අනියම් පදනම මත සේවය කරන නිලධාරීන් 03 දෙනෙකුට සියයට 25 ක දීමනා වශයෙන් එකතුව රු.306,707 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 14. ශීර්ෂය 14 - නීතිපති දෙපාර්තමේන්තුව

### 14.1 විගණන විෂය පථය

නීතිපති දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 17 දින නීතිපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 14.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 14.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි සඳහන් කර ඇති පොදු නිරීක්ෂණ සහ පහත 14.4 සිට 14.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක AIA/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා පරිගණක මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංකය 01401 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,366,194 ක් වූ අතර එයින් රු.866,051 ක් වසර පහකට අධික කාලයක සිට අය නොවී පැවතුණි.

**14.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම.**

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ එක් රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

**14.5 කාර්යසාධනය**

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පහත දක්වා ඇති අංශ මගින් ඉටු කර තිබුණි.

(අ) අපරාධ නඩු අංශය

(ආ) සිවිල් අංශය

(ඇ) රාජ්‍ය නීති අංශය

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණය

(ඉ) සංස්ථා අංශය

ඊට අමතරව විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකකද ක්‍රියාත්මක වේ.

(අ) මහජන පෙත්සම් ඒකකය

(ආ) ළමා අපචාර නඩු ඒකකය

(ඇ) EER ඒකකය ( හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ පවරන නඩු)

(ඈ) ආගමන විගමන ඒකකය

ඉහත සඳහන් අංශ හා ඒකක අතරින් සිවිල් අංශය , අපරාධ අංශය හා ළමා අපචාර නඩු ඒකකය යටතේ වර්ෂ 3 ක කාර්යසාධනය සංක්ෂිප්ත කර පහත දැක්වේ.

| | වර්ෂය | | |
|---|---|---|---|
| සිවිල් අංශය | 2011 | 2012 | 2013 |
| විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | 2,641 | 2,714 | 2,710 |
| වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | 176 | 158 | 231 |
| වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව | 2,465 | 5,021 | 7,500 |
| අපරාධ අංශය | | | |
| විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | 5,464 | 7,176 | 5,221 |
| වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | 5,029 | 5,451 | 6,474 |
| වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව | 435 | 2,160 | 907 |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | | | |
| විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | 2,460 | 3,372 | 3,836 |
| වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | 1,390 | 1,294 | 1,910 |
| වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව | 1,070 | 3,148 | 5,074 |

## 14.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 221 | 176 | 45 |
| (ii) | තෘතියික මට්ටම | 12 | 10 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 167 | 101 | 66 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 233 | 172 | 61 |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | 05 | 05 | - |
| | එකතුව | 638 | 464 | 174 |

2014 නොවැම්බර් 11 දින වන විට ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 45 ක් හා ද්විතියික මට්ටමේ එක් පුරප්පාඩුවක් දෙපාර්තමේන්තුව විසින් පුරවා නොතිබුණි.

## 15. ශීර්ෂය 15 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

### 15.1 විගණන විෂය පථය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 28 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 15.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 15.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 15.4 සිට 15.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

---

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.40,010,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 04 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 76 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**15.4 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

---

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---

ඇස්තමේන්තුගත පිරිවැය රු.185,000,000 ක් වූ ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

**15.5 මානව සම්පත් කළමනාකරණය**

---

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 | 10 |
| (ii) තෘතියික මට්ටම | 28 | 04 | 24 |
| (iii) ද්විතියක මට්ටම | 62 | 28 | 34 |
| (iv) ප්‍රාථමික මට්ටම | 24 | 20 | 04 |
| (v) වෙනත් | 03 | 03 | - |
| එකතුව | 154 | 82 | 72 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 72 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**16. ශීර්ෂය 16 - පාර්ලිමේන්තුව**

---

**16.1 විගණන විෂය පථය**

---

පාර්ලිමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 15 දින පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්,

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 16.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 16.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පාර්ලිමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 16.4 සිට 16.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පාර්ලිමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| පරිගණක, උපාංග හා පරිගණක මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

**(ආ) විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොකිරීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොතිබීම නිසා එම ගිණුම් විෂයයන් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | පාර්ලිමේන්තුවේ මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම | 14,608,780 | අදාල ලිපි ගොණුව |
| (ii) | විදේශ සම්බන්ධතා හා සංධාන කාර්යාලය වියදම් | 10,000,000 | කිසිදු තොරතුරක් |
| (iii) | සම්මාදම් හා දායක මුදල් | 9,500,000 | කිසිදු තොරතුරක් |
| (iv) | විදේශ සම්බන්ධතා හා සංධාන කාර්යාලය හා සම්මාදම් හා දායක මුදල් 2008 සිට 2012 දක්වා | 237,600,000 | කිසිදු තොරතුරක් |
| (v) | පාර්ලිමේන්තු පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව සඳහා වියදම් | 87,300,000 | කිසිදු තොරතුරක් |

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරුදීම**

පාර්ලිමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) අයවැය විචලනය**

වැය විෂයයන් 18 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.59,432,028 ක් වූ අතර එම ඉතිරිය වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් සියයට 82 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

**------------------------**

2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.2,464,152 ක් වූ අතර. විගණනයට ඉදිරිපත් කළ තැන්පත්වල කාල විශ්ලේෂණයේ එකතුව රු.2,453,502 ක් විය. ඒ අනුව රු. 10,650 ක වෙනසක් අනාවරණය විය.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 01601 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,928,695 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ණය ශේෂය රු. 1,928,695 ක් වූ අතර එම ණය ශේෂයෙන් සියයට 55 ක් හෙවත් රු. 1,057,862 ක් වසර 5 කට වැඩි කාලයක සිට පැවැත එන ණය ශේෂයන් විය.

(iii) වැඩ තහනම් කර තිබුණු නිලධාරීන්ගෙන් අයකර ගත යුතු ණය ශේෂ එකතුව රු.94,240 ක් වූ අතර ඉන් රු.91,990 ක් වසර 16 කට වඩා පැරණි ශේෂයන් විය. මෙම ණය ශේෂයයන් අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(iv) සාමාජික ණය ලේඛනයේ නිලධාරීන් ලබාගත් ණය වර්ග අනුව පිළියෙල කර නොතිබුණි.

**16.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**16.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**--------------------------- --**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2//3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**16.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**---------------------------------------------------------**

කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටුව රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් වාර තුනක් පමණක් පවත්වා තිබුණි.

**16.5 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2014 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, පාර්ලිමේන්තුව විසින් 2014 සැප්තැම්බර් 30 දින වන විටත් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2011 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.32,333,311 ක් විය.

## 16.6 අනුකූල නොවීම්

--------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) 1953 අංක 09 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය පනතේ 4 වන වගන්තිය | - | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 10 ක් ලබාදිමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ii) 1953 අංක 09 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය පනතේ 5 වන වගන්තිය | - | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය උපදේශක කාරක සභාවට වැටුප් ගෙවීම් සම්බන්ධ කොන්දේසි, කුලී දීමනා, වෙනත් දීමනා, වැටුප් වර්ධක ප්‍රදානයන්, නිවාඩු, විශ්‍රාමික වයස හා විශ්‍රාම වැටුප් ආදිය සම්බන්ධව මුදල් රෙගුලාසි සකස් කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| II වැනි පරිච්ඡේදයේ 2.1 වගන්තිය | - | (i) ආයතනය විසින් විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර නොතිබුණි.<br>(ii) අමාත්‍ය මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවේ මාධ්‍ය නිලධාරී තනතුර අනුමත කිරීමේදී, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශවලට යටත්ව අනුමත කර තිබුණි. එම කොමිෂන් සභාව විසින් නිර්දේශ කර තිබුණු අවම සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරියකු එම තනතුර සඳහා බඳවා ගෙන තිබුණි.<br>(iii) ගෘහ පාලන සහායක තනතුරෙහි සේවය කළ සේවකයකු භාණ්ඩ |

| | | | |
|---|---|---|---|
| | | | භාරගැනීමේ තනතුරටත්, උද්‍යාන නඩත්තු සහායක (අනියම්) තනතුරේ සේවය කළ සේවකයකු භාණ්ඩ භාර ගැනීමේ තනතුරටත් පත්කර තිබුණි. මෙම පත් කිරීම් සඳහා අදාළ සේවකයන්ගේ ඉල්ලීම පමණක් පදනම් කර ගෙන තිබූ අතර පත්වීම් ලිපියෙහි, එම සේවකයාගේ ඉල්ලීම මත එම තනතුරට පත් කළ බව සඳහන් කර තිබුණි. |
| **(ඈ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 115(3)(ආ) | 1,782,523 | අධිකාර බලය ලත් නිලධාරියෙකුගේ සහතිකය නොමැතිව ගෙවීම් කර තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 754(4) | - | ටයර් තොග ලේඛනය විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 102, 103, 104 හා 110 | 8,775 | සමරු අලෙවි හලෙහි නැතිවූ භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ඈ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | - | සෑම මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| **(ඉ)** | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| | 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන චක්‍රලේඛයේ 1.1 ඡේදය | - | වාහන අපහරණයේදී වසර 10 ට වඩා පැරණි ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන සඳහා ප්‍රමුඛතාවය හිමි විය යුතු වුවත්, වාහන අපහරණයේදී මේ පිළිබඳ අවධානය යොමු නොකර වසර 5 කට අඩු වාහන අපහරණය කර තිබුණි. |

## 16.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

2007 වර්ෂයේ සිට පාර්ලිමේන්තුවේ වසා දමන ලද පැරණි බැංකු ජංගම ගිණුමේ මුදල් පොත අනුව රු.1,315,440 ක අයිරා ශේෂයයක් පැවැතුණ බව 2013 ජනවාරි 01 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. එම අයිරා ශේෂයෙන් 2013 වර්ෂයේදී රු.596,548 ක් නිරවුල් කළ බව 2013 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට තවදුරටත් රු.718,891 ක අයිරාවක් පැරණි ජංගම ගිණුමේ පවතින බවට බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් වේ. විගණනයේදී එම ගනුදෙනු සනාථ කිරීමට තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා අයිරාව හා නිරවුල් කිරීමේ නිවැරදිභාවය ගැන සෑහීමකට පත්විය නොහැකි විය.

## 16.8 අවිධිමත් ගනුදෙනු

පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනවලදී ප.ව. 6.30 න් පසු සේවයේ යෙදෙන නිලධාරීන්ට ප්‍රවාහන දුෂ්කරතා සැලකිල්ලට ගෙන ගෙවනු ලබන ප්‍රවාහන දීමනාව නිල වාහන පහසුකම් සපයා ඇති නිලධාරීන්ටද ගෙවා තිබුණි.

## 16.9 විසඳා නොතිබුණු විගණන ඡේද

පාර්ලිමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද සම්බන්ධයෙන් විධිමත් පරිදි පියවර ගෙන නොතිබූ අතර එම ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2009 | 5 (අ) ii | පාර්ලිමේන්තුවේ නිලධාරින් දෙදෙනෙකු පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණු බැවින් ඉතිරි කර ගත් විවේක නිවාඩු සඳහා ගෙවනු ලබන දිරිදීමනා වශයෙන් 2008 හා 2009 වර්ෂවලදී එකතුව රු.264,910 ක් ගෙවා තිබුණි. |
| | 7 (ඇ) | 2009 වර්ෂයේදී ඇරඹි මුළුතැන්ගෙයි නවීකරණ කටයුතු සඳහා 2010 ජුනි 30 දින වන විට |

| | | |
|---|---|---|
| | | රු.20,141,658 ක් වැයකර තිබුණත් මුළුතැන්ගෙයි පවිත්‍රතාවය රැකෙන ආකාරයට ජල අපවහන පද්ධතිය සකස් කර නොතිබුණි. |
| 2011 | 1.5 (අ) (i) | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය උපදේශක කාරක සභා අනුමැතියකින් තොරව පාර්ලිමේන්තු මහ ලේකම් විසින් නිලධාරීන් තිදෙනෙකුට වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 14 ක් ලබාදී තිබුණි. |

**16.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 51 | 4 | - |
| (ii) | තෘතියික මට්ටම | 150 | 128 | 22 | - |
| (iii) | ද්විතියික මට්ටම | 208 | 190 | 18 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 470 | 445 | 25 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 73 | 83 | - | 10 |
| | **එකතුව** | **956** | **897** | **69** | **10** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

( අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 69 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

## 17. ශීර්ෂය 17 - පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය

### 17.1 විගණන විෂය පථය

පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 14 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 17.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 17.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය වාර්තා හා පොත් අනුව විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 17.4 සිට 17.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විගණන විමසුම්වලට පිළිතුරු දීම**

**--------------------------------------**

කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

**--------------------**

වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එකතුව රු.138,629 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ත් සියයට 16 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**17.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**17.4.1 අභ්‍යන්තර විගණනය**

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**17.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා තිබුණි.

**17.5 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) VII වන පරිච්ඡේදයේ 9.3 වගන්තිය | - | 2004 වර්ෂයේ සිට වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 10 ක් සියළුම නිලධාරීන්ට ලබා දී තිබුණි. |
| (ii) XXI වන පරිච්ඡේදය | 42,000 | නිල ඇදුම් දීමනා හිමි නිලධාරීන්ට අමතරව මාණ්ඩලික නොවන නිලධාරීන් 07 දෙනෙකු සඳහාද නිල ඇදුම් දීමනාව ලබා දී තිබුණි. |
| (ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන චක්‍රලේඛයේ 02ඡේදය | | නිලධාරීන් 05 දෙනෙකු පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. |
| 03 ඡේදය | | කාර්යාලයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසළකා සෑම කාර්යාලයකම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 2013 අප්‍රේල් 22 දිනැති අංක 05/2013 දරන චක්‍රලේඛයේ 02 (අ) වගන්තිය | 22,000 | නිල ඇඳුම් හිමි නිලධාරීන්ට චක්‍රලේඛය අනුව හිමි ප්‍රමාණය ඉක්මවා ගෙවීම් සිදු කර තිබුණි. |

## 17.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

සභානායක කාර්යාලයේ දීප ව්‍යාප්ත සේවාවන් වන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සේවය කර තිබූ අතර එම නිලධාරීන්ට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ලබාදුන් වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව අවස්ථා 4 කදී වැටුප් වර්ධක 10 ක්ද ලබා දී තිබුණි. මෙම නිලධාරීන් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයෙන් බැහැරව වෙනත් දෙපාර්තමේන්තු හෝ අමාත්‍යාංශවලට ස්ථාන මාරුවීම් ලබන අවස්ථාවකදී එම ආයතනවල සේවයේ නියුතු සමාන්තර සේවාවල අනෙකුත් නිලධාරීන්ගේ වැටුප සමග විෂමතාවයක් ඇති විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 17.7 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

-------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 10 | 08 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 11 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| | **එකතුව** | **31** | **26** | **05** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 05 ක් පිරවීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.

## 18. ශීර්ෂය 18 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය

---

### 18.1 විගණන විෂය පථය

---

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 14 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 18.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 18.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) හි දක්වා ඇති පොදු

නිරීක්ෂණය සහ පහත 18.4 සිට 18.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**--------------------**

වැය විෂයයන් 01 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.76,328 ක් වූ ඉතිරිය එම වැය විෂයයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක ප්‍රමාණයක් වී තිබුණි.

## 18.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**--------------------------------------**

### 18.4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 18.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

**-----------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීමට පමණක් කටයුතු කර තිබුණි.

## 18.5 බේරුම් නොකළ බැරකම්

**--------------------------**

කාර්යාලය විසින් විසර්ජන ගිණුමේ දක්වා තිබුණු 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු බැරකම්වල එකතුව රු. 107,531 ක් විය. මෙම බැරකම්වලට අමතරව රු.1,030,862 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

## 18.6 අනුකූල නොවීම්

**---------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XXI පරිච්ඡේදයේ 2 හා 3 වගන්ති | 90,000 | ආයතන සංග්‍රහය අනුව නිල ඇඳුම් හිමි නිලධාරින්ට අමතරව කාර්යාලයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් 15 දෙනෙකු වෙතද නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2013 අප්‍රේල් 22 දිනැති අංක 05/2013 දරන චක්‍රලේඛයේ 02 (ආ) ඡේදය | 36,000 | චක්‍රලේඛ විධිවිධාන අනුව හිමි නිළ ඇඳුම් දීමනාව ඉක්මවා නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණි. |
| (ii) 2009 ජුනි 17 දිනැති අංක 09/2009(i) චක්‍රලේඛයේ 2 (1) ඡේදය | - | නිලධාරින් 04 දෙනෙකු පැමිණීම හා පිටවීම, කිසිදු ලේඛනයක අත්සන් කර නොතිබුණි. |
| (iii) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 02(iv) ඡෙදය | - | රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී ප.ව. 6.30 න් පසු සේවය කිරීම වෙනුවෙන් දිනකට ගෙවනු ලබන රු.750 ක දීමනාව, පැමිණීමේ ලේඛනය මගින් හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් හෝ පැමිණීම හා පිටවීම සනාථ නොකළ නිලධාරීන් හතර දෙනෙකුට ගෙවා තිබුණි. |
| (iv) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | - | ආයතනයේ සිටින සේවක සංඛ්‍යාව ගැන නොසළකා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**18.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී සේවයේ යෙදෙන නිලධාරීන්ට ප්‍රවාහන දුෂ්කරතා සැලකිල්ලට ගෙන ගෙවන ලද දිනකට රු. 750 ක දීමනාව නිල වාහන හිමි නිලධාරීන්ටද ගෙවා තිබුණි.

**18.8 අවිධිමත් ගනුදෙනු**

1953 අංක 9 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනතේ 4 වන වගන්තියට පටහැනිව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව අවස්ථා 4 කදී අමතර වැටුප් වර්ධක 10 ක් නිලධාරීන් සඳහා ලබා දී තිබුණි.

**18.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 09 | 08 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 15 | 11 | 04 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 16 | 01 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | **එකතුව** | **43** | **38** | **06** | **01** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 06 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමත සේවක සංඛ්‍යාවට අමතරව විශ්‍රාමික නිලධාරියකු අනියම් පදනම මත සේවයේ යොදවා තිබුණි.

## 19. ශීර්ෂය 19 - පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලය

---

### 19.1 විගණන විෂය පථය

---

පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 15 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 19.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 19.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 19.4 සිට 19.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**--------------------------------------------**

කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| (i) පරිගණක හා පරිගණක මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**(ආ) විගණන විමසුම්වලට පිළිතුරුදීම**

**--------------------------------------**

කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් එකකට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.1,797,660 ක් හෙවත් එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් සියයට 54 ත් අතර පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ii) රක්ෂණ ගාස්තු වශයෙන් වැය කර තිබුණු රු. 117,720 ක පුනරාවර්තන වියදම මුලධන වැය විෂයයක් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**19.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**
**------------------------------------------**

**19.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**---------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**19.4.2 අභ්‍යන්තර විගණනය**

--------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**19.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**--------------------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**19.5 වත්කම් කළමනාකරණය**
**------------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**
**-----------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | යතුරු පැදි | 01 | වසර 02 |
| (ii) | පරිගණක (මොනිටර්) | 02 | වසර 02 |
| (iii) | පරිගණක (UPS) | 05 | වසර 02 |
| (iv) | සෙලියුලර් දුරකථන | 01 | වසර 02 |
| (v) | ටේප් රෙකෝඩර් | 01 | වසර 02 |

**19.6 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
| --- | --- | --- |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | රු | |
| (i) XXVIII වැනි පරිච්ඡේදයේ 1.1 වගන්තිය හා 1989 නොවැම්බර් 30 දිනැති අංක 58/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | | ලේකම්වරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරිය පැමිණීමේ ලේඛනයේ පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. |
| (ii) XII වන පරිච්ඡේදයේ 23 වගන්තිය, V වන පරිච්ඡේදයේ 7.1,7 හා 2,7.3 වගන්ති සහ VII වන පරිච්ඡේදයේ 1.6 වගන්තිය | 70,770 | ලේකම්වරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරිය විධිමත් පරිදි නිවාඩු අනුමත කර නොගෙන සේවයට වාර්තා කර නොතිබුණි. එම කාලය තුළදී නිලධාරිනිය අනුමැතියකින් තොරව විදේශ ගත වී තිබුණත් ඇයට එම කාලයට අදාළව සම්පූර්ණ වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 135(1) | | එක් එක් ගනුදෙනුව නිලධාරීන් කිහිපදෙනෙකු මාර්ගයෙන් පරීක්ෂණයට භාජනය වන පරිදි මූල්‍ය බලතල බෙදීමක් සිදු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 135(4) | | 2013 වර්ෂයේ මුදල් පාලනය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සම්බන්ධ කාර්යභාරය පැවැරීමේදී නිශ්චිත මුදල් සීමාවන් දක්වා විධිමත්ව ලේඛනය පිළියෙල කර නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 141 (3) | | මුදල් රෙගුලාසි 139 ප්‍රකාරව ගෙවීම් වවුචර්වලට සම්බන්ධ නිලධාරියකු විසින් මුදල් රෙගුලාසිවලට පටහැනිව ගෙවීම් වෙනුවෙන් නිකුත් කරනු ලබන චෙක්පත්වල දෙවැනි අත්සන්කරු වශයෙන් කටයුතු කර තිබුණි. |
| (ඇ) | | **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**<br>------------------------------ | | |
| | | 2012 අප්‍රේල් 09 දිනැති අංක පීසී/එම්ඩී/ඒඩී/2/1/1/26 දරන චක්‍රලේඛයේ (ආ) වගන්තිය | | විගණන විමසුම් සම්බන්ධයෙන් කාර්යාලය විසින් ක්ෂණික හා කාලීන පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>----------------------------- | | |
| | (i) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 හා 05 ඡේද | 36,512 | අතිරේක ඉන්ධන අනුමත කිරීමකින් තොරව වාහනයක් සඳහා රජයේ ඇණවුම් මගින් ඉන්ධන ලබා ගෙන තිබුණි. |
| | (ii) | 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන චක්‍රලේඛයේ 02 ඡේදය | | ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණු අතර නිලධාරීන් කිහිප දෙනෙකු කාර්යාලය පවත්වා ගෙන යන පැමිණීමේ ලේඛනයේද අත්සන් කර නොතිබුණි. |
| | (iii) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 06 ඡේදය | 16,440 | සම්බන්ධීකරණ ලේකම්වරියට විදේශ ගත වූ මාසයක කාල පරිච්ඡේදය වෙනුවෙන්ද ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |
| | (iv) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 3 ඡේදය | | සුදුසුකම් ලත් යාන්ත්‍රික ඉංජිනේරු වරයෙකුගේ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව වාහන අළුත්වැඩියා සිදුකර තිබුණි. |
| | (v) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 | | වැයවූ ඉන්ධන ප්‍රමාණය සහ ධාවනය කරන ලද දුර ප්‍රමාණය |

| | | | |
|---|---|---|---|
| | දරන චක්‍රලේඛයේ 4.11 ඡේදයේ | | ධාවන සටහන් වල දිනපතා ඇතුළත් කර නොතිබුණි. |
| (vi) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍ර ලේඛයේ 2.11 ඡේදය | | සෑම මාස 06 කට වරක් දැවෙන ඉන්ධන ප්‍රමාණය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඉ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| | 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛයේ 3 ඡේදය | 721,143 | යානාපත්‍ර මිලදී ගැනීම් හා ගුවන් ගමන් සංවිධානය කිරීමේ කටයුතු රාජ්‍ය බැංකු යටතේ පාලිත සමාගම් වලින් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | **ජාතික අයවැය චක්‍රලේඛ** | | |
| | 2008 අප්‍රේල් 04 දිනැති අංක 138 දරන චක්‍රලේඛය | | විපක්ෂ නායක කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව ඇස්තමේන්තුගත මුදල රු.2,957,984 කින් ඉක්මවා තිබුණත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (උ) | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| (i) | 3.4.3 (අ) මාර්ගෝපදේශය | | මිලදී ගැනීමේ අවස්ථා 05 ක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කර නොතිබුණි. |
| (ii) | 3.4.3 (ඇ) මාර්ගෝපදේශය | | 2013 වර්ෂය සඳහා සැපයුම් කරුවන් ලියාපදිංචි කර නොතිබුණි. |

## 19.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී ප.ව. 6.30 න් පසු සේවයේ යෙදෙන නිලධාරීන් සඳහා ප්‍රවාහන දුෂ්කරතා සැලකිල්ලට ගෙන දිනකට රු.750 ක දීමනාවක් ගෙවා තිබූ අතර නිල වාහන හිමි නිලධාරීන් තිදෙනෙකුට මෙම ප්‍රවාහන දීමනාව ගෙවා තිබුණි.

(ආ) විපක්ෂ නායක කාර්යාලය අළුත්වැඩියා කිරීම සම්බන්ධව කුලී ගිවිසුමේ සඳහන් කොන්දේසිවලට පටහැනිව අවස්ථා 4 කදී රු. 3,150,000 ක් ගෙවා තිබුණි.

(ඇ) විපක්ෂ නායක කාර්යාලයේ අතිරේක ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නිර්මාණ ශිල්පීන්ගේ වෘත්තීය ගාස්තු හා ව්‍යාපෘති කළමනාකරණ ගාස්තු සහ භාණ්ඩ හා මෙවලම් මිලදී ගැනීමට රු. 28,400,000 ක් භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට 2011 ජූනි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මෙම අනුමැතිය නොසළකා 2012 නොවැම්බර් 01 දින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ රු.33,924,645 ක ( එකතු කළ අගය මත බදු රහිත) ප්‍රමාණපත පිළිගෙන 2012 දෙසැම්බර් 31 දින වන විට රු.31,357,984 ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි.

(ඈ) ඉන්ධන දහනය ලීටරයකට කිලෝමීටර 08 ක් ව පැවති වාහනයක කිලෝමීටර 789 ක ගමනක් යාම සඳහා ඉන්ධන ලීටර 170 ක් ලබාගෙන තිබුණි. ඒ අනුව ඉන්ධන ලීටර 71 ක් වැඩිපුර ලබා ගෙන තිබුණි.

## 19.8 අධිකාරී බලය නොතිබුණු ගනුදෙනු

---------------------------------------

අධිකාරී බලය නොළත් පහත සඳහන් ගනුදෙනු විගණනයේදි නිරීක්ෂණය විය.

(අ) 1953 අංක 9 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනතේ 4 වන වගන්තියට පටහැනිව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව අවස්ථා 4 කදී අමතර වැටුප් වර්ධක 10 ක් නිලධාරීන් සඳහා ලබා දී තිබුණි.

(ii) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/1 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විදේශ ගමනක දී දිවයිනෙන් පිටත්වූ වේලාවේ සිට නැවත දිවයිනට පැමිණීම දක්වා දින ගණන අනුව දීමනා ගෙවීමේදී රු.281,103 ක් වැඩි පුර ගෙවා තිබුණි.

**19.9 පාඩු හා හානි**

----------------

අවස්ථා 04 කදී සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් රක්ෂණ වන්දි වශයෙන් රු.242,935 ක් ලැබී තිබුණත්, විසර්ජන ගිණුමේ හානි හා පාඩු පිළිබඳ ප්‍රකාශයේ එම විස්තර දක්වා නොතිබුණි.

**19.10 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 02 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 11 | 06 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 21 | 20 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 16 | 01 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 10 | 10 | - |
| | එකතුව | 62 | 54 | 08 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 08 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර සහකාර ලේකම් තනතුර හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර පිළිවෙලින් 2011 අගෝස්තු 31 දින සිට හා 2012 දෙසැම්බර් 31 දින සිට පුරප්පාඩුව පැවැතුණි.

## 20. ශීර්ෂය 20 - මැතිවරණ දෙපාර්තමේන්තුව

## 20.1 විගණන විෂය පථය

මැතිවරණ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 20.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 20.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මැතිවරණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හී දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 20.4 සිට 20.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 02001 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.972,966 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.

**20.4 අවිධිමත් ගනුදෙනු**

---------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) මැතිවරණ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලට එකතු කිරීම්, වැඩිදියුණු කිරීම්, මැතිවරණ කොමසාරිස්වරයාගේ නිල කාමරය හා සම්බන්ධ වැසිකිළිය, නාන කාමරය අලුත්වැඩියා කිරීමේ කටයුතු වෙනුවෙන් රු.43,806,496 ක ඇස්තමේන්තුවක් මත ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.250,000 ක් ඉක්මවන වැඩ සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු වෙත 2013 මාර්තු 08 දින හා 2013 ජූලි 08 දින පිළිවෙලින් රු.මිලියන 10 ක් හා රු.මිලියන 12 ක් ගෙවා තිබුණත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 මාර්ගෝපදේශය ප්‍රකාරව (Retention Money) මුදලක් රඳවා ගෙන නොතිබුණි.

(ආ) 2012 අගෝස්තු 25 දිනැති අංක PCE/24/2012 දරන මැතිවරණ කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව විශාල අලුත්වැඩියාවන් සඳහා වියදම් දැරීමට සිදුවන වාහන ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදා නොගත යුතු වුවද, අළුත්වැඩියා තත්ත්වයේ පැවැති රජයේ දෙපාර්තමේන්තුවක් සතු වාහනයක් 2012 සැප්තැම්බර් 08 දින පැවති පළාත් සභා ඡන්ද විමසීම් කටයුතු සඳහා යොදාගෙන තිබුණු අතර එහි අළුත්වැඩියාවන් වෙනුවෙන් රු.883,921 ක් මැතිවරණ දෙපාර්තමේන්තුව වැය කර තිබුණි.

**20.5 මානව සම්පත් කළමනාකරණය.**

-----------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-------------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 32 | 09 |
| (ii) | තෘතීයික මට්ටම | 13 | 06 | 07 |
| (iii) | ද්විතීයික මට්ටම | 481 | 338 | 143 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 158 | 143 | 15 |
| | **එකතුව** | **693** | **519** | **174** |

2013 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු 174 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 21. ශීර්ෂය 21 - විගණකාධිපති

### 21.1 විගණන විෂය පථය

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 17 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 21.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 21.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 21.4 සිට 21.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පාඩු හා හානි ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

---

වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.55,315,546 ක්වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 62 ත් සියයට 91 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) ආදායම් ගිණුම**

---

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ගිණුම් 01 කට අනුව රු.189,455,801 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 03 ක් අතර කාල පරාසයකට අදාල විය.

(ii) අදාල වන වර්ෂය පිළිබඳව නොසළකා, විගණන ගාස්තු බිල්පත නිකුත් කළ දිනය අනුව ගිණුම්ගත කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා ඒ හේතුවෙන් ඇතැම් මහ නගර සභා, නගර සභා, දේශීය සභා හා සංස්ථා මණ්ඩල වැනි අර්ධ රාජ්‍ය ආයතන අතරින් කොටසක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් 2009 සිට 2012 දක්වා ඇතැම් වර්ෂයන් සඳහා බිල්පත් නිකුත් කර ගිණුම්ගත කර නොතිබුණි.

(iii) බිල්පත් ඉදිරිපත් කර තිබුණත් ඇතැම් ආයතනවලින් දීර්ඝ කාලයක සිට විගණන ගාස්තු අය වී නොතිබුණි.

(iv) ඇතැම් ආයතන වෙතින් පෙර වර්ෂයන් සඳහා විගණන ගාස්තු අයවී නොතිබුණත්, සමාලෝචිත වර්ෂයට හා මෑත වර්ෂයන් සඳහා විගණන ගාස්තු අය කර තිබුණි.

(v) දෙපාර්තමේන්තු යටතේ පවත්නා ඇතැම් අරමුදල් විගණනය කර තිබුණත්, විගණන ගාස්තු බිල් ඉදිරිපත් කර අයකරගෙන නොතිබුණි.

(vi) සංස්ථා මණ්ඩල සහ අර්ධ රාජ්‍ය ආයතන වෙතින් විගණන ගාස්තු අයකිරීම සඳහා අදාල අමාත්‍යාංශය වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේදී අසාමාන්‍ය ප්‍රමාදයන් සිදු වී තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------------

විෂය අංක 02101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,340,243 ක් විය.

## 21.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුව ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.

## 21.5 වත්කම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

------------------------------------------

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/ 01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2014 ඔක්තෝබර් 31 දින වන විටත් ශාඛා 05 කට අදාල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 21.6 මානව සම්පත් කළමනාකරණය

----------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 354 | 213 | 141 |
| (ii) | ද්විතියික මට්ටම | 1,215 | 824 | 391 |
| (iii) | තෘතියික මට්ටම | 177 | 138 | 39 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 181 | 118 | 63 |
| | එකතුව | 1,927 | 1,293 | 634 |

## 22. ශීර්ෂය 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය

### 22.1 විගණන විෂය පථය

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 05 දින කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 22.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ

වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 22.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 22.4 සිට 22.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| පරිගණක, උපාංග හා පරිගණක මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 02201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.62,987 ක් විය.

**22.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**22.4.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**22.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**22.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුදල් රෙගුලාසි 94(1) ට අනුකූල නොවන පරිදි වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.39,220 ක බැරකම්වලට එළඹ තිබුණි.

**22.6 කාර්යසාධනය**

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත ලැබී තිබුණු 2012 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ පැමිණිලි සංඛ්‍යාව 682 ක්ද , 2013 වර්ෂයේ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 1,482 ක්ද වශයෙන් මුළු පැමිණිලි සංඛ්‍යාව 2,164 ක් සමාලෝචිත වර්ෂයේදි විමර්ශනය කිරිමට තිබුණි. සමාලෝචිත වර්ෂයේදි පැමිණිලි 131 කට නිර්දේශය ලබා දි තිබුණු අතර, සුදුසු කටයුතු සඳහා වෙනත් ආයතන වෙත යොමු කරන ලද ලිපිගොනු 127 ක්ද , මැදිහත් විය නොහැකි ලිපිගොනු 192 ක්ද වශයෙන් ලිපිගොනු 450 ක කටයුතු අවසන් කර තිබුණි.

**22.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | _ |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 18 | 10 | 08 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 08 | 02 | 06 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | **එකතුව** | **30** | **15** | **15** |